
2024

# ශ්‍රී ලංකා රජය සඳහා ප්‍රමුඛතා 5 ක්



ARUTHA

# මීළඟ ලංකා රජය සඳහා ප්‍රමුඛතා 5 ක්

2024

© 2024 Policy Research Services (Guarantee) Ltd. සියලු හිමිකම් ඇවිරිණි..

මෙම සටහන රෝෂි ඒකනායක, උමේෂ් මොරමුදලි, යෙනුලි රණවීර, මධූෂා තවපාලකුමාර් හා රෙහානා තව්ෆීක් විසින් ලියන ලදී. එය යොලානි ප්‍රනාන්දු හා අමලිනි ද සේරා විසින් සංස්කරණය කරන ලදී.

වාර්තා නිර්මාණය: රෝෂි ඒකනායක

වෙබ් අඩවිය: https://arutharesearch.org/

විද්‍යුත් තැපෑල : info@arutharesearch.org

# හැඳින්වීම

ශ්‍රී ලංකාව වේගයෙන් ජනාධිපතිවරණයකට එළෙඹෙමින් සිටී. ඒ ඉහළ ජීවන වියදම, ණය පිළිබඳ සංකීර්ණ සාකච්ඡා සහ ප්‍රතිසංස්කරණ රාශියක් ඇතුළු සැලකිය යුතු ආර්ථික අභියෝගවල මුහුණ දෙන පසුබිමක් තුළදීය.

මෙම බරපතළ ගැටළු විසඳීම සඳහා ජනාධිපති අපේක්ෂකයින් සහ දේශපාලන පක්ෂ විසින් ආර්ථික ප්‍රතිපත්ති මෙන්ම මැතිවරණ ප්‍රතිඥා කිහිපයක් ද ඉදිරිපත් කර ඇත. ජනාධිපතිවරණයේ අවසාන ප්‍රතිඵලය කුමක් වුවත්, මැතකාලීන අර්බුදවලින් සාධාරණ සහ යුක්තිසහගත ප්‍රතිසාධනයක් උදෙසා රටේ ආර්ථිකයේ තීරණාත්මක ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

ඉදිරි රජයක් විසින් මෙම තීරණාත්මක කාල පරිච්ඡේදය තුළ ප්‍රමුඛතාවය ලබා දිය යුතු ක්ෂේත්‍ර පහක් මෙම ප්‍රතිපත්ති සාරාංශයේ ගෙනහැර දක්වන අතර ගැටළු විසඳීම සඳහා ගත යුතු ප්‍රතිපත්ති යෝජනා කරයි.

මෙම අන්තර් සම්බන්ධිත ප්‍රමුඛතා ක්ෂේත්‍ර ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සඳහා පරිපූර්ණ උපාය මාර්ගයක අවශ්‍යතාවය පිළිබිඹු කරයි. ශ්‍රී ලංකාව යුක්ති සහගත සහ තිරසාර ලෙස අනාගතයට ගෙන යාමට කැපවී සිටින ඕනෑම රජයක් විසින් මෙම උපාය මාර්ගය භාවිතා කළ යුතුය.




ඡායාරූපය: ඇලෙක්ස් අසබාවේ

# 1



ඡායාරූපය: දෙවින් හේවගේ


# මන්දපෝෂණය

ARUTHA

# මන්දපෝෂණය

2021 වසරේ සිට ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණය උග්‍ර වී ඇති අතර එය පෙර වසරවල නිරීක්ෂණය වූ පහළ වැටීමේ ප්‍රවණතාවයේ ආපසු හැරීමක් පෙන්නුම් කරයි. පහත 1 ප්‍රස්ථාරයෙන් නිරීක්ෂණය කර ඇති පරිදි, බොහෝ ළමා පෝෂණ දර්ශක 2021 සිට ඉහළ ගොස් ඇති අතර, ශ්‍රී ලංකාව ස්වෛරී ණය ගෙවීම පැහැර හැරීමේ සිට දිගටම ඍණාත්මක අතට හැරී ඇත. රටවල් විසින් ස්වෛරී ණය ගෙවීම් පැහැර හැරීමේ අවස්ථා වල සෞඛ්‍ය ප්‍රතිඵල කෙරෙහි මෙවැනි ඍණාත්මක, අසමානුපාතික සහ දිගු කල්පවතින බලපෑමක් ඇති බව මෑත කාලීන පර්යේෂණ මගින් සොයා ගන්නා ලදී. මෑත කාලීන ඇස්තමේන්තුවලින් පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ කුටුම්භවලින් 90%ට වැඩි ප්‍රමාණයක් ආහාර අනාරක්ෂිත බවින් පීඩා විඳින බවයි. මෙය 2009 දී ඒ හා සමාන ඇස්තමේන්තුවක් හා සැසැඳූ විට හාත්පසින්ම වෙනස් තත්ත්වයක් වන අතර එම 2009


**ප්‍රස්ථාරය 1: ශ්‍රී ලංකාවේ ළමා පෝෂණ දර්ශක 2016-2023**




මූලාශ්‍රය: පවුල් සෞඛ්‍ය කාර්යාංශය

ඇස්තමේන්තුවෙන් පෙන්නුම් කළේ ආහාර අනාරක්ෂිත බවින් පීඩා විඳින්නේ කුටුම්භවලින් 12% ක් පමණක් බවයි. ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාවයේ ශීඝ්‍ර පරිහානියකට ශ්‍රී ලාංකිකයන් මුහුණ දී සිටින බව මෙයින් පෙන්නුම් කෙරේ. තවමත් ශ්‍රී ලංකාව ස්වෛරී ණය ගෙවීම පැහැර හැරීමේ මුල් අවධියේ සිටින නමුත්, මේ තත්ත්වය සමනය නොකළහොත්, ඉදිරියේදීත් මන්දපෝෂණ අර්බුදය වඩාත් දරුණු සෞඛ්‍ය හා සමාජීය ප්‍රතිඵල වලට තුඩු දිය හැකි බව පැහැදිලිය. දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් පසු උද්ධමනය අඩු වී ඇත. කෙසේ වෙතත්, අධික ලෙස මුදල් මුද්‍රණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම නිසා මිලදී ගැනීමේ හැකියාව සීඝ්‍රයෙන් අඩු විය. අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාම ජීවන වියදමට දැඩි ලෙස බලපා ඇත. අර්බුදයට පෙර පැවති මට්ටමට වඩා මිල ගණන් 3-4 ගුණයකට ආසන්න ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත.

**ප්‍රස්තාරය 2: කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ ආහාර මිල උද්ධමනය (පදනම: 2013=100)**




මූලාශ්‍රය: මිල හා වේතන අංශය, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
*2023හි අන්තර්ගත වන්නේ (2021=100) කොළඹ පාරිභෝගික මිල දර්ශකය අනුව ගණනය කළ අගයන් වේ

අඩුවෙමින් පවතින සිය සැබෑ ආදායම කළමනාකරණය කරමින් තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට මිනිසුන් විවිධ ක්‍රමවේදවලට යොමුවෙමින් සිටිති. UNICEF සමීක්ෂණයක් වාර්තා කරන්නේ 89% ක් කුටුම්භයන් තම බඩු බාහිරාදිය විකිණීම හෝ උකස් කිරීම, මුදල් ණයට ගැනීම හෝ සිය ඉතුරුම් භාවිතා කිරීම වැනි ක්‍රමවේද අනුගමනය කර ඇති බවයි. එම සමීක්ෂණයේම පෙර වටයන්ට වඩා මෙය කැපී පෙනෙන වැඩිවීමකි.

ආහාර මිල, අධ්‍යාපනය සහ සෞඛ්‍ය වැනි අනෙකුත් වියදම් සීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් ශ්‍රී ලංකාවේ කුටුම්භයන් ආහාර පාලනය කිරීමේ විවිධ යාන්ත්‍රණයන් වෙත යොමු වී ඇත. ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සහ ලෝක ආහාර වැඩසටහන (WFP) විසින් සිදු කරන ලද අධ්‍යයනයකට අනුව කුටුම්භයන් 61%ක් ආදායම ප්‍රමාණවත් නොවූ බැවින් නිතරම ආහාර ප්‍රමාණය පාලනය කිරීමේ යාන්ත්‍රණයන් භාවිතා කර ඇති බව පෙනී යයි. කුටුම්භවලින් 25%ට ආසන්න ප්‍රමාණයක් ආහාර පරිභෝජනය කරන වාර ගණන අඩු කරන බව වාර්තා කළ අතර කුටුම්භවලින් අඩකට ආසන්න ප්‍රමාණයක් (46%) ගන්නා ආහාර කොටසේ ප්‍රමාණය අඩු කරන බව වාර්තා කළහ.

2022 මාර්තු මාසයේ සිට කුටුම්භවලින් 78% ක් සිය සමස්ත ආහාර පරිභෝජනය අඩු කර ඇති බව UNICEF සමීක්ෂණය වාර්තා කරයි. කුටුම්භවලින් 80%ට වැඩි ප්‍රමාණයක් අත්‍යවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ සහිත පලතුරු සහ එළවළු හා ප්‍රෝටීන් බහුල කිරි සහ මස්, මාළු සහ බිත්තර වැනි ආහාර පරිභෝජනය අඩු කර ඇත. 2021 අග භාගයේ සිට යකඩ සපිරි ආහාර පරිභෝජනය ද ශීඝ්‍රයෙන් පහත වැටී ඇත. මෙම කාලය තුළදීම ප්‍රෝටීන් සහ යකඩ බහුල ආහාරවල මිල සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බැවින් මෙය පුදුමයට කරුණක් නොවේ.

ආහාර සහ පෝෂණ අනාරක්ෂිතභාවය පිළිබඳ මෙම සොයාගැනීම් ලෝක ආහාර සංවිධානය සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය විසින්

ප්‍රකාශයට පත් කරන ලද වාර්තා මගින් සනාථ වේ. විශේෂයෙන් ග්‍රාමීය සහ වතු ක්ෂේත්‍රවල කුටුම්භවලට, ගැබිනි හෝ කිරි දෙන මව්වරුන් සිටින කුටුම්භවලට, පවුලේ සාමාජිකයන් බොහෝ ගණනක් සිටින හෝ ආබාධිත සාමාජිකයකු සිටින කුටුම්භවලට හා ආදායම් සඳහා 'නුපුහුණු ශ්‍රමය' මත යැපෙන කුටුම්භවලට මෙම බලපෑම දැඩි ලෙස දනී ඇති බව මෙම අධ්‍යයනයන් පෙන්වා දෙයි. මේ උග්‍ර මන්දපෝෂණ අර්බුදය නොසලකා හැරිය නොහැක. සැබෑ ආදායම අහිමිවීම හේතුවෙන් අනුගමනය කරන ලද ආහාර රටාවේ වෙනස්වීම් පෝෂණ දර්ශකවලට බලපාන බවට පූර්ව සංඥා පවතී. ළමා මන්දපෝෂණයේ වර්ධනය වීම් හේතුකොට ගෙන සෞඛ්‍ය හා සමාජීය දර්ශක මත නිරන්තර හා දිගුකාලීන බලපෑමක් ඇතිවීම වැළැක්වීමට වේගවත් ලෙස මැදිහත්වීමක් අවශ්‍ය වේ.

# නිර්දේශ

**ආහාර සහ ආහාර අමුද්‍රව්‍ය සඳහා තීරු බදු සහ පැරා තීරු බදු ඉවත් කිරීම**

- දේශීය කර්මාන්තයට දේශීය ආහාර ඉල්ලුම සම්පූර්ණයෙන්ම සපුරාලීමට නොහැකි වුවද, ආනයනික ආහාර විකල්පයන් සඳහා ඉහළ ආනයන තීරුබදු මගින් මිල නියම කෙරේ. මේ නිසා පාරිභෝගිකයින් මිල අඩු විකල්ප ආනයනික ආහාර තෝරාගැනීම සීමා කරයි. මෙය ආහාර ද්‍රව්‍ය මිල පහත වැටීමට ඍජුවම බලපානු ඇත.

**ආහාර ආනයනය ලිහිල් කිරීම**

- සහල් සහ එළවළු වැනි දේශීය නිෂ්පාදිත ආහාර වර්ග ආනයනය, බෙදා හැරීම සහ සැපයීම භාරව සිටින දේශීය වෙළඳුන් කිහිප දෙනෙකු විසින් සැපයුම පාලනය කිරීම සහ උපක්‍රමිකව මිල හැසිරවීම සිදු කරනබැවින් ඒ උත්සාහයන් පරාජය කිරීම සඳහා නිදහස් වෙළඳ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.

**ප්‍රමාණවත්ලෙස ඉහළ නැංවූ අයවැය ප්‍රතිපාදන තුළින් රජයේ පෝෂණ වැඩසටහන් ශක්තිමත් කිරීම**

- පාසල ආශ්‍රිතව ආහාර ලබා දීම, ත්‍රිපෝෂ, ආහාර වවුචර සහ අනෙකුත් රජයේ පෝෂණ වැඩසටහන්වල ගැඹුර සහ ආවරණය ශීඝ්‍රයෙන් වැඩි කිරීම සඳහා ඉහළ අගයකින් යුත් හදිසි සහ ඉක්මන් අයවැය ප්‍රතිපාදන නැවත වෙන් කිරීම සිදු කළ යුතුය.

- මෙම වැඩසටහන් මගින් ළමුන්, ගැබිනි සහ කිරි දෙන මව්වරුන්, අඩු ආදායම්ලාභී පවුල් සහ ආබාධිත හෝ වැඩිහිටියන් සිටින කුටුම්භ මෙන්ම අවිධිමත් සහ නුපුහුණු ශ්‍රමයේ ආදායම මත යැපෙන කුටුම්භ ඇතුළු විශේෂයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඉලක්ක කළ යුතුය.

**කෘෂිකර්ම අංශයේ ආයෝජන සඳහා පහසුකම් සැපයීම**

- මෙම අංශය ආයෝජන සඳහා විවෘත කිරීමට පියවර ගත යුතු අතර එය තරඟකාරී ලෙස වර්ධනය කිරීමට ඉඩම් හිමිකම් ගැටළුව වැනි දිගුකාලීන ගැටළු විසඳීමට පියවර ගත යුතුය.

**පෝෂණ අධ්‍යාපනය**

- සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු පිළිබඳ පෝෂණ අධ්‍යාපනය සහ උපදේශන යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම: කුමන ආහාර තෝරා ගත යුතුද, ඒවා පිළියෙළ කරන්නේ කෙසේද, විවිධ ආහාර ද්‍රව්‍යවල පෝෂණ ප්‍රතිලාභ සහ සන්දර්භීය හා සංස්කෘතික වශයෙන් අදාළ වන සමබර ආහාර වේලක් පිළිබඳව දැනුවත් කිරීම. පාසල්, මාතෘ සායන සහ රෝහල් වැනි දැනට පවතින පද්ධති ඔස්සේ මෙය සිදු කළ හැකිය.

2



ඡායාරූපය: ජුලියාටා

# ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය

ARUTHA

# ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්ව අනුපාතය කලාපීය අනෙකුත් රටවලට වඩා සංසන්දනාත්මකව පසුගාමී ය; 2023 දී මෙම අනුපාතය 32.5% ක් පමණකි. ශ්‍රම බලකායේ කාන්තාවන් සංඛ්‍යාව වැඩි කිරීම වැදගත් වන නමුත්, අවධානය සහභාගිත්වයෙන් ඔබ්බට යා යුතුය. වැටුප් සමානාත්මතාවය බලාත්මක කරන, වෘත්තීය දියුණුව සඳහා මාර්ග සපයන එමෙන්ම රැකියා ස්ථානයේ හිරිහැර වලින් ආරක්ෂා කරන යහපත් රැකියා අවස්ථා සඳහා කාන්තාවන්ට ප්‍රවේශය ඇති කිරීම අත්‍යවශ්‍ය වේ. අඩු කාන්තා සහභාගීත්ව අනුපාතයට සාධක රැසක් දායක වන අතර එමගින් කාන්තාවන්ගේ ආර්ථික සවිබල ගැන්වීමට බාධා ඇති කර රටේ ආර්ථික විභවයද සීමා කෙරේ.

ශ්‍රී ලාංකේය සමාජය තුළ, කාන්තාවන් බොහෝ විට ඔවුන්ගේ රැකියා තත්ත්වය නොසලකා දරුවන්ගේ සහ වැඩිහිටියන්ගේ රැකවරණය සඳහා වැටුප් නොලබන සත්කාර කටයුතු භාර ගැනීම අපේක්ෂා කරන අතර එය ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය සඳහා බාදකයක් ලෙස ක්‍රියා කරයි. කොවිඩ්-19 වසංගතය නිසා පාසල් සහ ළමා සුරැකුම් මධ්‍යස්ථාන වසා දැමීම, කාන්තාවන් මත පැටවුනු සත්කාරක අවශ්‍යතා තීව්‍ර කිරීමට හේතු විය. ආර්ථික අර්බුදය කාන්තාවන්ගේ අවදානම් සහගත තත්වය තවදුරටත් ඉස්මතු කළේය. බොහෝ දෙනෙකුට තම රැකියාවේ සේවා කාලය අඩු කිරීමට හෝ නිවසේ ඉහළ ගිය සත්කාර ඉල්ලීම් කළමනාකරණය කිරීමට ශ්‍රම බලකායෙන් සම්පූර්ණයෙන්ම ඉවත් වීමට සිදු විය.

විධිමත් සහ අවිධිමත් අංශ යන දෙකෙහිම ප්‍රමිතිගත මාතෘ ප්‍රතිලාභ නොමැතිකම තවත් දැවෙන ප්‍රශ්නයකි. නිදසුනක් වශයෙන්, සාප්පු සහකාර්යාලවලට අදාළ ව්‍යාපාරවල සේවයේ නියුතු සියලුම සේවිකාවන්ට මාතෘ ප්‍රතිලාභ ලබා දෙන සාප්පු සහ කාර්යාල සේවක පනත වැනි නීති මගින් සමහර කාන්තාවන් ආවරණය වේ. කෙසේ වෙතත්, පුණ්‍ය කටයුතු සඳහා මාසයක් හෝ ඊට අඩු කාලයක් සේවයේ යෙදී සිටින, අවමංගල්‍ය කටයුතු සම්බන්ධ ව්‍යාපාරවල යෙදී සිටින, පාසල් නිබන්ධන කාර්ය මණ්ඩලය ලෙස සේවය කරන, හෝ මුරකාරියක හෝ සත්කාරිකාවක ලෙස සේවය කරන කාන්තාවන් සාප්පු සහ කාර්යාල පනත මගින් බැහැර කරයි. තවත් උදාහරණයක් ලෙස, මාතෘ ප්‍රතිලාභ ආඥාපනත අනියම් සේවකයන් බැහැර කරයි. මෙම විෂමතා නිසා ව්‍යවස්ථාපිත මාතෘ ප්‍රතිලාභ හිමි නොවන කාන්තාවන්ට තම අලුත උපන්බිළිඳුන් රැකබලා ගැනීම හෝ රැකියාවේ නියැලීම යන දෙකෙන් එකක් තෝරා ගැනීමට සිදු වන අතර, එමඟින් ශ්‍රම බලකායේ සහභාගීත්වය අඩු වීමට හෝ ශ්‍රම වෙළඳපොළෙන් සම්පූර්ණයෙන්ම ඉවත් වීමට පවා හේතු විය හැක.

වර්තමාන නීති මඟින් කාන්තාවන් සඳහා රාත්‍රී වැඩමුර සීමා කරන අතර, බොහෝ කර්මාන්තවල රාත්‍රී 8 දක්වා පමණක් වැඩ කිරීමට ඔවුන්ට ඉඩ සලසයි. මෙවැනි නීති

කාන්තාවන් ආරක්ෂා කිරීම අරමුණු කරගත් ඒවා වුවද, අනෙක් අතට එමගින් රාත්‍රී සේවා මුර අවශ්‍ය අංශවලට කාන්තාවන් බඳවාගැනීමට සේවායෝජයයන් අධෛර්යමත් කරයි.

රැකියාවල නියුතු කාන්තාවන් පවා නිවසේ සත්කාරක වගකීම්ද සිදු කළයුතු බැවින්,අවිධිමත් සහ සාන්තරායකර අංශවල රැකියාවලට මෙන්ම විරැකියාවට වුවද තල්ලු කළ හැකිය. විශේෂයෙන්ම සේවක අර්ථසාධක අරමුදල (EPF) හෝ සේවක භාරකාර අරමුදල (ETF) වැනි සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවලට ප්‍රවේශය නොමැති කාන්තාවන්ගේ මූල්‍ය ස්වාධීනත්වයට සහ ආරක්ෂාවට එය බලපායි. සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්කෘතිකමය වශයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සම්මතයන් වෙනස් කිරීම අවශ්‍ය බවපිළිගත යුතු නමුත් මෙම ගැටළු සමහරක් සඳහා ප්‍රතිපත්ති මට්ටමින් යම් වෙනස්කම් සිදු කළ හැකිය. කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික අර්බුදය සමඟ, විශේෂයෙන්ම පසුගිය වසර කිහිපය තුළ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) අංශය දැඩි අභියෝගවලට මුහුණ දුන්නේය. එම අංශයේ කාන්තාවන් දැඩි ලෙස පීඩාවට පත් විය. සිය ව්‍යාපාර නැවත ආරම්භකිරීමට හෝ ඉදිරියට ගෙන යාමට තැත් කිරීමේදී කාන්තාවන් මුහුණ දෙන ප්‍රධාන බාධාවක් වන්නේ ප්‍රාග්ධනයට ප්‍රවේශය නොමැති වීමයි. රජය, රාජ්‍ය නොවන සංවිධාන හෝ පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් සහිත වැඩසටහන් ඔස්සේ ඔවුන්ගෙන් සාපේක්ෂ වශයෙන් කුඩා පිරිසක් තමන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට පෙළඹී ඇත. ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් තිබිය හැකි වුවද, මූල්‍ය සාක්ෂරතාව නොමැතිවීම නිසා කාන්තාවන් අවාසි සහගත ගිවිසුම්වලට එළඹීමට හේතු විය හැක.

# නිර්දේශ

**කාන්තාවන්ට රැකියාවකට යාමට සහයෝගය ලබා දීම**

- කාන්තාවන්ට එරෙහි ලිංගික හිංසනය සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට නීති ක්‍රියාත්මක කිරීම.
- උසස් තත්ත්වයේ සහ දැරිය හැකි මුදලකට ප්‍රාදේශීය මට්ටමින් ළමා ආරක්ෂණ පහසුකම් වැනි පොදු සත්කාරසේවා පුළුල් කිරීමට ආයෝජනය කිරීම.
- ස්ථානීය ළමා ආරක්ෂණ පහසුකම් සහ සේවා සැපයීමට සේවා යෝජකයන් දිරිමත් කිරීම සඳහා ඉලක්කගත සහනාධාර හඳුන්වා දීම.
- නම්‍යශීලී ලෙස සහ දුරස්ථව රැකියා කිරීම පහසු කිරීම සඳහා නීතිමය ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම.
- මෙම වාර්තාවේ ඉදිරි කොටසේ විස්තර කර ඇති පරිදි පොදු ප්‍රවාහනයේ ගුණාත්මකභාවය, ආරක්ෂාව, සුවපහසුව සහ ප්‍රවේශ්‍යතාව වැඩිදියුණු කිරීමට ආයෝජනය කිරීම.
- කාන්තා මගීන්ගේ නිශ්චිත අවශ්‍යතා සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු විසඳීම සඳහා පොදු ප්‍රවාහන පද්ධති සැලසුම් කිරීමේ කටයුතු වලදී කාන්තාවන් සම්බන්ධ කර ගැනීම.

අධ්‍යාපනය සහ සවිබලගැන්වීම

- ගැහැණු ළමයින් හට විවිධ වෘත්තීය මාර්ග සඳහා ප්‍රවේශය ලබා ගැනීමට සීමාවාසික පුහුණුව, ආධුනිකත්ව සහ රැකියා ස්ථානයේ පුහුණුව ලබා දීම සඳහා පුහුණු ආයතනවලට පුද්ගලික අංශය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- මූල්‍ය සාක්ෂරතාව සහ අත්‍යවශ්‍ය මූල්‍ය කළමනාකරණ කුසලතා පාසල් විෂයමාලාවලට ඒකාබද්ධ කිරීම.
- ධාරිතා වර්ධනය සඳහා සම්පත් ලබා දීමෙන් කාන්තා ව්‍යවසායකත්වයට සහාය වීම.
- ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම මඟින් අහිතකර ක්‍රියාමාර්ග ඉවත් කිරීම සහ වඩාත් ප්‍රායෝගික ආපසු ගෙවීමේ ව්‍යුහයන් සහ කාල රාමු සඳහා පහසුකම් සැලසීම.

# 3




ඡායාරූපය: දෙවින් හේවගේ

# පොදු ප්‍රවාහනය


ARUTHA

# පොදු ප්‍රවාහනය

කාර්යක්ෂම, ආරක්ෂිත සහ යහපත් ප්‍රමිතියක් සහිත පොදු ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීමෙන් පැහැදිලි ප්‍රතිලාභ රැසක් අත්වේ. ප්‍රවාහන සම්බන්ධතාවය සැපයීමට අමතරව, එය නාගරික තදබදය සහ මාර්ග අනතුරු අවම කිරීමට උපකාරී වේ. විශ්වාසදායක සහ ආරක්ෂිත පොදු ප්‍රවාහනයක් මඟින් පුද්ගලික ප්‍රවාහනයට සීමිත ප්‍රවේශයක් ඇති දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවයි. කාන්තාවන් සහ ආබාධිත පුද්ගලයින් ඇතුළු පුරවැසියන්ට රැකියා සහ අධ්‍යාපන අවස්ථාවලට ප්‍රවේශය ලබා දීමටත් එමඟින් ඉඩ සලසයි. හොඳ තත්ත්වයේ පොදු ප්‍රවාහනය වැඩි දියුණු කිරීම ෆොසිල ඉන්ධනවල පරිභෝජනය අඩු කරන අතර වාතයේ ගුණාත්මකභාවය වැඩි දියුණුකරයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ප්‍රවාහන පද්ධතිය පුද්ගලික වාහන හිමිකම කේන්ද්‍ර කර ඇති අතර, පොදු සහ සමූහ ප්‍රවාහනය නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම කෙරෙහි බෙහෙවින් අඩු අවධානයක් යොමු කර ඇත.

2019 වසරේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නවතම සංඛ්‍යාලේඛන වලට අනුව කොවිඩ්-19 වසංගතයට පෙර සමස්ත ගමන්වාරවලින් (මගී/කි.මී.) 1/3 ට වැඩි ප්‍රමාණයක් පෞද්ගලික බස් රථ ඇතුළු බස් රථ මාර්ගයෙන් සිදු කරන ලදී.

**ප්‍රස්තාරය 3 : වාහන ගහණය 2017-2022**




**මූලාශ්‍රය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

කෙසේ වෙතත්, සමස්ත වාහන ප්‍රමාණය සැලකූ කල පුද්ගලික වාහන හිමිකාරිත්වයේ පැහැදිලි වර්ධනයක් දක්නට ලැබිණි. 2017 සිට 2022 දක්වා මෝටර් රථවල 20%ට ආසන්න වැඩිවීමක් සිදුවූ අතර එම කාලය තුළදීම බස් රථවල වැඩිවීම 5%ක් පමණ විය (ප්‍රස්තාරය 3)


පොදු ප්‍රවාහනය ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක භාවයෙන්ද අඩුය. 2018, 2019 සහ වඩාත් මෑත 2024 දී ද ජාතික අයවැය කතා වලදී මේ සම්බන්ධයෙන් විවිධ පොරොන්දු ලබා දී ඇත. විදුලියෙන් ක්‍රියා කරන, පත්ල පහත් සුඛෝපභෝගී බස්රථ හඳුන්වා දීමෙන් බස්රථ පද්ධති වැඩිදියුණු

කිරීම මෙන්ම පෞද්ගලික අංශයට මෙම වෙනස්කම් අනුගමනය කිරීම සඳහා දිරිගැන්වීම් ද මෙම යෝජනා තුළ ඇතුළත් විය. මේවා ප්‍රමාණවත් ලෙස ඉටු වී නැත.

එසේම, දුම්රිය ප්‍රවාහනයද ප්‍රමාදයන්, අකාර්යක්ෂමතාවයන්, මඟී තදබදය, ගුණාත්මක බවින් අඩු සේවාව සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න වැනි ගැටළු වලට නිරන්තරයෙන් මුහුණ දී ඇත. දැනට ඇස්තමේන්තු කර ඇති පරිදි අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග 300-400 ක් ඇත. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අනුව 2022 වසරේ පමණක් දුම්රිය හරස් මාර්ගවල අනතුරු 94ක් සහ මරණ 18ක් සිදුවී ඇත.

රජයේ වියදම්වලින් ද වඩා හොඳ පොදු ප්‍රවාහනය සඳහා ප්‍රමාණවත් සහයෝගයක් නොමැතිකම පෙන්නුම් කෙරේ (ප්‍රස්තාරය 4). මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම මඟින් පිළිඹිබු වන පරිදි අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා සම්පත්වලින් සැලකිය යුතු කොටසක් කැප කර ඇත. අධිවේගී මාර්ග නිසා පොදු ප්‍රවාහනයට යම් ප්‍රමාණයකට පහසුකම් සැපයෙන නමුත්, සමාජයේ බහුතරයකට ප්‍රතිලාභ ලැබෙන ප්‍රවාහන පද්ධති ප්‍රමුඛතා කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

**ප්‍රස්තාරය 4 : අයවැය වෙන් කිරීම – ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය 2024**




මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශය

## නිර්දේශ

**අවම ගුණාත්මක හා ආරක්ෂණ ප්‍රමිතීන් යෙදීම**

- කාර්ය මණ්ඩල පුහුණුව, නිල ඇඳුම් නිකුත් කිරීම සහ උපරිම මගී ධාරිතාව වැනි ආරක්ෂක ප්‍රමිතීන් නියාමනය කිරීම මෙයට ඇතුළත් විය යුතුය. මෙම ප්‍රමතීන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ හැකි අතර, පසුව පුද්ගලික අංශයට අනුගමනය කළ හැකිය.

**උසස් තත්ත්වයේ බස් රථ වැඩි කිරීමට දිරිගැන්වීම් ලබා දීම**

- බස් ගාස්තු සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමකින් තොරව, පෞද්ගලික අංශයේ ලාභදායිත්වය ද සහතික කරමින් උසස් තත්ත්වයේ බස් රථ ආනයනය කිරීමට, අඩු පොලී ණය පහසුකම් ලබාදීම සහ තීරු බදු ඉවත් කිරීම. පොදු ප්‍රවාහනය සඳහා පත්ල පහත් බස් රථ යෙදවීමට පහසුකම් සැලසීම. මෙය ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් ආරම්භ කළ හැකි අතර ඉන්පසු පුද්ගලික අංශයටත් එය ක්‍රියාත්මක කිරීම සඳහා පොලී සහනාධාර ලබාදීම.

**කාන්තාවන් සහ ආබාධිත පුද්ගලයින් වැනි කාණ්ඩ සඳහා පොදු ප්‍රවාහනය සහ යටිතල පහසුකම්වල ආරක්ෂාව සහ ඇතුළත් බව සඳහා ප්‍රමුඛත්වය ලබා දීම**

- ලිංගික අතවර සිදු කරන පුද්ගලයන් ගැන වාර්තා කිරීම සඳහා මාර්ග වැඩි කිරීම සහ එවැනි පුද්ගලයන්ට එරෙහි දඬුවම් දැඩි ලෙස බලාත්මක කිරීම මෙන්ම වීදි ආලෝකකරණය ඇතුළු නගර සැලසුම් වැඩිදියුණු කිරීම. අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබා දීම; දුරස්ථව ක්‍රියාත්මක වන ඉලෙක්ට්‍රොනික දුම්රිය ගේට්ටු සඳහා වන ව්‍යාපෘතිය පුළුල් කළ හැක.
- රෝද පුටු බෑවුම්, අත් වැටවල් සහ ආබාධිත පුද්ගලයන්ට පහසුවෙන් කියවිය හැකි සංඥා වැනි මූලික ප්‍රවේශ්‍යතා අවශ්‍යතා සපුරාලන සේවා සහ ප්‍රවාහන මධ්‍යස්ථාන හඳුන්වා දීම.

**ප්‍රවාහන පද්ධති හා යටිතල පහසුකම් ප්‍රවර්ධනය වඩාත් හොඳින් නියාමනය කිරීම**

- මාර්ග බලපත්‍ර නිකුත් කිරීම දැඩි පරීක්ෂාවකට යටත් කර සියලුම මාර්ග බලපත්‍ර ටෙන්ඩර් හෝ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ඔස්සේ නිකුත් කරන බවට සහතික කිරීම. ස්වාධීන තාක්ෂණික කමිටුවක් සියලු මාර්ග බලපත්‍ර තක්සේරු කළ යුතුය; ජාතික ගමනාගමන කොමිෂන් සභාව හෝ පළාත් බලධාරීන් විසින් මාර්ග බලපත්‍ර නිකුත් කිරීම සඳහා මෙම කමිටුවේ අනුමැතිය අවශ්‍ය විය යුතුය.

**ප්‍රවාහන පද්ධති උපාය මාර්ගික කිරීම**

- නාගරික මධ්‍යස්ථානවල තදබදය අවම කිරීම සඳහා අධික තදබදයක් ඇති ප්‍රදේශවලට සහ සම්බන්ධතා මධ්‍යස්ථානවලට කඩිනම් සංක්‍රාන්ති බස් පද්ධති (Bus Rapid Transit) හඳුන්වා දීම.

- අවශ්‍ය පරිදි කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල බස් මංතීරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- ඒකාබද්ධ කාලසටහන් හඳුන්වා දීමෙන් පෞද්ගලික සහ ලං.ග.ම. බස් රථ අතර තරගය අවම කළ හැකිය.

**ඩිජිටල් තාක්ෂණය හා නවෝත්පාදන උපයෝගී කර ගැනීම**

- ආසන වෙන්කිරීම, ටිකට් සඳහා ගෙවීම් කිරීම, දුම්රිය සංඥා මෙහෙයුම්, ප්‍රවාහන සේවා සජීවී නිරීක්ෂණය සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයන් ආදිය නව තාක්ෂණය යොදාගෙන වැඩිදියුණු කිරීම. 2013 සහ 2016 බස් රථ සඳහා වූ ප්‍රවේශ කාඩ් ව්‍යාපෘතිය වැනි පෙර නියමු මගින් ලැබූ ඉගෙනුම් භාවිතා කර බස්නාහිර පළාතෙන් ආරම්භ කළ හැකි මුල්පිරීම් ක්‍රියාත්මක කිරීම.

4



ඡායාරූපය: UNESCO-UNEVOC/සඳුනි සිරිපාල

# තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව (TVET)

ARUTHA

# තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව (TVET)

අර්ථවත් රැකියා සහ ආර්ථික ප්‍රගමනය සඳහා අවශ්‍ය නිපුණතාවලින් පුද්ගලයන් සන්නද්ධ කිරීමේදී ශ්‍රී ලංකාවේ TVET අංශය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, TVET අංශයේ වර්තමාන තත්ත්වයට ශ්‍රම වෙළඳපොලේ ඉල්ලුම සපුරාලීමට නොහැකි ය.


TVET වැඩසටහන් වල ගුණාත්මක බව මූලික වශයෙන් අවධානයට ලක්විය යුතු කරුණකි. ශ්‍රම වෙළඳපොලේ පුළුල් පරාසයක වෘත්තීන් පැවතුනත්, මේවා සඳහා ප්‍රවේශ සීමා වන්නේ TVET ආයතන මෙයින් 100කට අඩු සංඛ්‍යාවක් සඳහා පමණක් පුහුණුව ලබා දෙන බැවිනි. මෙහිදී ගැටළු විසඳීම, කණ්ඩායම් ලෙස වැඩ කිරීම සහ නායකත්වය වැනි මෘදු කුසලතා වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු වන්නේ අඩු වශයෙනි.

මීට අමතරව, විෂයමාලා බොහෝ විට කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීමට අපහොසත් වේ. උපාධිධාරීන්ගේ ප්‍රායෝගික කුසලතා, සාමාන්‍ය ව්‍යාපාරික ඥානය සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය පිළිබඳව සේවා යෝජකයින් සෑහීමට පත් වී නොමැත. විශේෂයෙන්ම ඉංග්‍රීසි සහ අනෙකුත් ප්‍රධාන භාෂා සඳහා වෘත්තීය පුහුණු ආයතන විසින් පිරිනමනු ලබන පුහුණුවේ ගුණාත්මකභාවය පිළිබඳව සංචාරක කර්මාන්තයේ සේවා යෝජකයින් විවේචනය කර ඇත.

සුදුසුකම් ලත් තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු උපාධිධාරීන් සඳහා ශක්තිමත් රැකියා ප්‍රතිපත්තියක් නොමැතිකම, ප්‍රශ්නය තවත් උග්‍ර කරයි. බොහෝ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු උපාධිධාරීන්ට ප්‍රමාණවත් ප්‍රායෝගික කුසලතා නොමැතිකම සහ ලැබුණු පුහුණුව ගුණාත්මක බවින් අඩුවීම හේතුවෙන් ඔවුන්ට සුදුසු රැකියාවක් සොයා ගැනීමට නොහැකි වී ඇත. ලෝක බැංකු අධ්‍යයනයකින් පෙනී යන්නේ සේවා යෝජකයින්ගේ අවශ්‍යතා සහ මනාපයන්ට ගැලපෙන පරිදි ප්‍රතිචාර දැක්වීමට TVET කර්මාන්ත අංශයේ දායකත්වය සීමිත වීම බාධාවක් වී ඇති බවයි.

රජයේ වාර්ෂික අයවැයෙන් 1%කට වඩා අඩු ප්‍රමාණයක් ලැබී ඇති TVET අංශය සෑමවිටම අරමුදල් හිඟ කමෙන් පීඩා විඳියි. මෙම දැඩි ඌන ආයෝජනය නිපුණතා සහිත මානව ප්‍රාග්ධනය සංවර්ධනයට සහ රටේ නව්‍යකරණයට බාධා පමුණුවයි. අයවැය සීමාවන් අධ්‍යාපනයේ ගුණාත්මක භාවයට ද බලපායි. ඒ උපදේශකයින්ට තරගකාරී වැටුප් පිරිනැමීමට සහ වෙළඳපල අවශ්‍යතා වලට අනුගත වීමට පුහුණු ආයතන අපහසු වන බැවිනි. ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපනය සඳහා 90% ක පමණ ඉහළ සහභාගිත්වයක් තිබුනද, TVET අංශය ඇතුළු තෘතීයික අධ්‍යාපනයට ඇත්තේ 23%ක් පමණ අඩු සහභාගිත්වයක් ය. මුදල් හිඟකම බොහෝ විට සිසුන්ට අධ්‍යාපනය හැර යාමට හේතු වන අතර, එම නිසා රැකියා සඳහා අවශ්‍ය කුසලතා ලබා ගැනීමට ඔවුන්ට නොහැකි වේ. TVET සඳහා ඇතුළත් වීමේදී භූගෝලීය අසමානතාවය කැපී පෙනෙන අතර එහිදී බස්නාහිර පළාත අනෙකුත් ප්‍රදේශ අභිබවා යයි.

ප්‍රස්තාරය 5: රාජ්‍ය අංශයේ තෝරාගත් පුහුණු ආයතනවල පුහුණු කාර්ය සාධනය 2021




මූලාශ්‍රය: ශ්‍රම වෙළඳපොළ තොරතුරු විවරණිකාව

විශේෂයෙන්ම වෘත්තීය අංශයේ උසස් අධ්‍යාපනය හදාරන සිසුන්ට ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය සැලකිය යුතු බාධාවක් වේ. ගුරුවරුන්ට පාසල් මට්ටමේදී ඉංග්‍රීසි මාධ්‍යයෙන් ධාරිතා වර්ධනය සඳහා ඇති පුහුණු අවස්ථා වල දැඩි හිඟයක් පවතී. කියවීමට සහ ලිවීමට ලබා දී ඇති වැදගත්කම වැඩි වීම නිසා සවන්දීමේ සහ කථා කිරීමේ කුසලතාවයේ වැදගත්කම යටපත් වීඇත.

## නිර්දේශ

**විෂයමාලා සහ කර්මාන්ත අතර අනුකූලතාවය වැඩි දියුණු කිරීම**

- තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු විෂයමාලාවට අලෙවිකරණය, සැපයුම්, සහ මානව සම්පත් කළමනාකරණය වැනි අත්‍යවශ්‍ය ව්‍යාපාරික කුසලතා ඇතුළත් කිරීම.
- සේවා යෝජකයන් විසින් හඳුනාගෙන ඇති කුසලතා හිඟතාවයන් සෘජුවම ආමන්ත්‍රණය කිරීම සඳහා TVET ආයතන සහ කර්මාන්ත අතර හවුල්කාරිත්වයන් වර්ධනය කළ යුතුය.

**ප්‍රවේශ්‍යතාවය හා සාධාරණත්වය වැඩිදියුණු කිරීම**

- පෞද්ගලිකව සපයනු ලබන TVET පාඨමාලා වල පිරිවැය දරා ගැනීමට අපොහොසත් සිසුන්ට, ගාස්තු සහ ජීවන වියදම් පියවා ගැනීම සඳහා ශිෂ්‍යත්ව, ප්‍රදාන හෝ අඩු පොලී ණය හරහා මූල්‍ය ආධාර සැපයීම.
- වඩා සාධාරණ පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා අඩු පහසුකම් සහිත ප්‍රදේශවල උසස් තත්ත්වයේ TVET වැඩසටහන් ලබා ගැනීමේ හැකියාව පුළුල් කිරීම.

**ගුරුවරුන්ගේ ධාරිතාවය හා සංවර්ධනය ශක්තිමත් කිරීම**

- නවීනතම ඉගැන්වීම් ක්‍රමවේද, විෂයමාලා සංවර්ධනය සහ අධ්‍යාපනයේ තාක්‍ෂණය භාවිතය තුළින් TVET උපදේශකයින් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයක් පවත්වාගෙන යාම.
- TVET අංශය තුළ  ගුණාත්මක බව සැමවිටම සහතික කිරීම සඳහා ගුරුවරුන් බඳවා ගැනීම් සහ පුහුණුව සඳහා සම්මත ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම.

**තාක්ෂණය හා දත්ත උපයෝගි කර ගැනීම**

- ඉගෙනීමේ අත්දැකීම වැඩිදියුණු කිරීම සඳහා අන්තර්ජාලයේ ඉගෙනුම් වෙබ් අඩවි, අතථ්‍ය පන්ති කාමර (virtual classroom) සහ ඩිජිටල් පුණරීක්ෂන මෙවලම් ඇතුළු මධ්‍යම තත්ත්වයේ තාක්‍ෂණික විසඳුම් උපයෝගි කරගැනිම. අන්තර්ජාල ඉගෙනුම් වෙබ්අඩවි සහ Google Classroom වැනි අධ්‍යාපනික යෙදුම්, බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර (multimedia projectors), අතථ්‍ය වයිට්බෝඩ් (virtual whiteboard) සහ එවැනි අංග මධ්‍යම තත්ත්වයේ තාක්‍ෂණයට ඇතුළත් විය හැකිය.
- වැඩසටහන් සැලසුම් කිරීම, සම්පත් වෙන් කිරීම සහ ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ දැනුම්වත් තීරණ ගැනීමට ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතිය සහාය වේ. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVET) සතුව දැනට ශ්‍රම වෙළඳපොළ තොරතුරු <u>පද්ධතියක්</u> පවතින නමුත්, දත්ත ක්ෂණිකව ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රකාශනය ප්‍රමාද වී ඇත. එබැවින්, වාර්තාවල කාලානුරූපී බව සහතික කිරීම සඳහා අදාළ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කළ යුතුය.

**ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය වැඩි දියුණු කිරීම**

- තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු  ආයතන සහ භාෂා පුහුණුව සපයන ආයතන අතර සහයෝගීතාවය දිරිමත් කිරීම.
- ගුරුවරුන්ට ඉහළ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා මට්ටම් ලබා ගැනීමට දිරිගැන්වීමේ වැඩසටහන් භාවිතා කිරීම.

5



ඡායාරූපය: හන්සන් සේන්

# සංචාරක කර්මාන්තය

ARUTHA

# සංචාරක කර්මාන්තය

විදේශ විනිමය අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංචාරක ඉපැයීම් මත දැඩි ලෙස රඳා පවතින බැවින් එම කර්මාන්තයරටේ මූල්‍ය ස්ථාවරත්වයේ සහ ආර්ථික වර්ධනයේ වැදගත් අංගයකි. ශ්‍රී ලංකාවේ භූ දර්ශනික විවිධත්වය, විචිත්‍රවත් සංස්කෘතික උරුමයන් සහ ආගන්තුක සත්කාරය ආදිය නිසා එය ස්වභාවිකව ලෙසම සංචාරක ගමනාන්තයක් බවට පත්වී තිබේ. කෙසේ වෙතත්, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා පුළුල් ජාතික සැලැස්මක් නොමැති වීම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ වර්ධනය බොහෝදුරට ඓන්ද්‍රිය වී ඇත. කර්මාන්තය මුහුණ දෙන කැපී පෙනෙන අභියෝග කිහිපයක් පවතින අතර ශ්‍රී ලංකාව සිය සංචාරක ඉපැයීම් මතදිගටම රඳා පවතිමින් කර්මාන්තය තිරසාර ලෙස වර්ධනය කිරීමට නම්, එම ගැටලු කඩිනමින් විසඳාගත යුතුය.

අර්බුදයෙන් පසු කාලයේ සංචාරක ව්‍යාපාරයේ ඇති වූ ප්‍රබෝධයත් සමඟ පසුගිය වසරේ සංචාරකයින් <u>මිලියන 1.48</u>ට වඩා වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකාව විසින් පිළිගෙන ඇත. මේ වසරේ ඊටත් වඩා වැඩි සංඛ්‍යාවක් අපේක්ෂා කළද මෙම සංචාරකයින්ගේ පැමිණීමට පහසුකම් සැලසීමටත් ඔවුන්ගේ සංචාරය තෘප්තිමත් කිරීමටත් ශ්‍රී ලංකාවට ඇති හැකියාව පිළිබඳව ගැටළු පවතී. විශේෂයෙන්ම කර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සම්බන්ධයෙන් රටේ පවතින සූදානම ගැන සංචාරක කර්මාන්තයේ පාර්ශවකරුවන් <u>සැක පළ කර</u> ඇත. සංචාරකයින්ගෙන් සැලකිය යුතු ආදායමක් එකතු වුවත් , අවශ්‍ය යටිතල පහසුකම් ගොඩනැගීම සඳහා මෙම මුදල් නැවත ආයෝජනය කළ බවක් දක්නට නොලැබේ.

පිරිසිදු පොදු වැසිකිළි වැනි මූලික පහසුකම් නොමැතිකම, අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රමාණවත් නොවීම සහ ප්‍රධාන සංචාරක ආකර්ෂණ පවතින ස්ථාන පවා නිසි පරිදි පවත්වා ගෙන යාමක් නොමැති වීම, සංචාරකයන්ගේ <u>අත්දැකීම හීන කරයි</u>. මෙවැනි හේතු සංචාරකයින් පැමිණීම හා දිගු කාලයක් රැඳී සිටීම වළක්වන අතර ඒ මඟින් දේශීය ආර්ථිකයට හානි වේ.

ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන යටිතල පහසුකම් තවත් බාධාවකි. බස් ගමන් වාර අනපේක්ෂිත වීම, හිඳගැනීමට අපහසු ආසන, තදබදය, අපරීක්ෂාකාරී රිය පැදවීම සහ දිගු ගමන් කාලයන් ආදි කරුණු බස් රථයෙන් ගමන් කිරීමට තෝරා ගන්නා සංචාරකයින්ගේ අපහසුතාවයන් තියුණු කරයි. අනෙක් අතට ගමනාගමනයට දුම්රිය තෝරා ගන්නා අයට ද අකර්මණ්‍ය හා අපිරිසිදු වැසිකිළි, හිඳගැනීමට අපහසු ආසනසහ අධික තදබදය වැනි කරුණු බලපායි. ත්‍රිරෝද රථ රියැදුරන් විසින් අත්තනෝමතික ලෙස මිල ගණන් නියම කිරීම නිසා ද සංචාරක ප්‍රදේශ ආශ්‍රිතව ගමන් කරන්නන් අපහසුතාවයට පත් වෙයි.

ශ්‍රී ලංකාවේ වීසා ලබා දීමේ ක්‍රියාවලියේ මෑත කාලීන වෙනස්කම් සංචාරක කර්මාන්තයට තවත් ප්‍රධාන බාධාවක් වී ඇත. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් VFS Global සමාගම මගින් මෙහෙයවූ අන්තර්ජාල වීසා ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවීම නිසා ඇතිවූ තත්ත්වයද ලංකාවට පැමිණීමට සිටින සහ පැමිණෙන සංචාරකයන් අතර ව්‍යාකූලත්වයට හේතු වී ඇත. දැනට ක්‍රියාත්මක වන පැමිණීමේ වීසා ක්‍රමය, ඇතුල්වීම සරල කිරීමට අදහස් කර ඇතත්, දුර්වල ලෙස ක්‍රියාත්මක කර ඇති අතර, දිගු

ප්‍රමාදයන් ඇති කරයි. ඇතැම් රටවලින් පැමිණෙන සංචාරකයන් පවා ගුවන් තොටුපළේදී හරවා යවා ඇත.

තවත් මූලික ගැටළුවක් වන්නේ ගමනාන්ත කළමනාකරණය සඳහා යහපත් උපාය මාර්ගයක් නොමැතිකමයි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) තුළ සංචාරක ප්‍රවර්ධනය මධ්‍යගත විම නිසා මෙම ප්‍රවර්ධන කටයුතු අකාර්යක්ෂම වී ඇත. . ශ්‍රී ලංකාව විසින් ප්‍රවර්ධනය කළ හැකි විවිධ ගමනාන්ත ස්ථාන සහ අත්දැකීම් ඵලදායී ලෙස සංචරකයන් වෙත අලෙවි කිරීමට මෙම උත්සාහයන් අසමත් වී ඇත. වඩාත් ප්‍රාදේශීයකරණය වූ කළමණාකාරිත්වයක් යොදා ගැනීමෙන් රට පුරා පිහිටි සංචාරක ගමනාන්තවල විශේෂිත බව වඩාත් හොඳින් පෙන්වා දිය හැ. ශ්‍රී ලංකාවේ කඳුකරයේ පෙකෝ මාර්ගය (Pekoe Trail) ප්‍රවර්ධනය කළමනාකරණය කිරීම සඳහා Pekoe Trail

සමාගම පිහිටුවීම වැනි ධනාත්මක පියවර කිහිපයක් ද තිබේ.සංචාරක වීසා මත රටට පැමිණ දකුණු හා නැගෙනහිර වෙරළ තීරයේ ව්‍යාපාරික කටයුතුවල නියැලෙන විදේශිකයන් සංඛ්‍යාව වැඩි වීම ද ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රයට මුහුණ දීමට සිදු වී ඇති තවත් අභියෝගයකි. දේශීය ආර්ථිකයට එහි බලපෑම පිළිබඳව කර්මාන්තයේ පාර්ශවකරුවන් කනස්සල්ල පළ කර ඇත. මෙම ව්‍යාපාර නියාමනය නොකළ ඒවා වන අතර දේශීය බදු සහ නීතිමය අවශ්‍යතා මගහැරීමට ඉඩ සලසයි. මෙය බලපත්‍රලාභී බදු ගෙවන දේශීය ව්‍යාපාර හිමියන් අතර විශාල කලකිරීමක් ඇති කර තිබේ. මෙම ව්‍යාපාර බොහෝ විට විදේශයන්ගෙන් ශ්‍රමිකයන් ගෙන්වා ගන්නා බැවින් දේශීය ශ්‍රමිකයන්ගේ රැකියා අවස්ථා ද සීමා වේ. ඇතැමුන් සංක්‍රමණ නීති උල්ලංඝනය කරමින් සංචාරක වීසා මත පුද්ගලයන් සේවයේ යොදවයි.

## නිර්දේශ

**පුහුණුව සහ දිරිගැන්වීම් මගින් ශ්‍රම හිඟයට පිළියම් යෙදීම**

- පුද්ගලික අංශය සමග සහයෝගයෙන් සංචාරක කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම.
- අදාළ පුහුණුව ලබා ගත් පුද්ගලයින්ට කර්මාන්තයේ රැකියා සහ ව්‍යාපාරික අවස්ථා සොයා ගැනීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම.
- දේශීය මාර්ගෝපදේශකයින් පුහුණු කිරීම සහ වැඩ කිරීමට ප්‍රමාණවත් අවස්ථා නිර්මාණය කිරීම.
- එක් එක් සංචාරකයින් ඔවුන් ප්‍රිය කරන දෑ මත පදනම් වූ සංස්කෘතික අත්දැකීම්, කාබනික වගාවන් හෝ ප්‍රජා මට්ටමේ ක්‍රියාකාරකම් ආදිය සිදුකරන ප්‍රාදේශිය මට්ටමේ කණ්ඩායම් සමග සම්බන්ධ කිරීම.

**යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තු කිරීම**

- සැමට ආරක්ෂිත සංචලනය සහතික කිරීම සඳහා දිවයින පුරා මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම; මෙයට මාර්ගනිසි පරිදි නඩත්තු කිරීම, වීදි ආලෝකකරණය සහ පොදු විවේකාගාර ඇතුළත් වේ. වන සතුන් විසින් පුද්ගලයන්ට අවදානමක් ඇති ප්‍රදේශවල ප්‍රමාණවත් වීදි ආලෝකකරණයක් සහ වඩා හොඳ ආරක්ෂක පියවරවල් ක්‍රියාත්මක කළ යුතුය.
- ලියාපදිංචි ව්‍යාපාරවලින් SLTDA විසින් එකතු කරන ලද සංචාරක සංවර්ධන බද්ද ඇතුළුව ගාස්තුවලින් උපයන ආදායම සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා නැවත ආයෝජනය කිරීම.

**වීසා ක්‍රියාවලි විධිමත් කිරීම**

- අන්තර්ජාල වීසා වෙබ් අඩවිය නැවත හඳුන්වාදීම සහ වැඩිදියුණු කිරීම, එහි පරිශීලක-හිතකාමී බව සහ විශ්වසනීය බවසහතික කිරීම. පවතින ක්‍රමයට සමාන තත්ත්වයක් නැවත ඇති නොවීමට ක්‍රියාත්මක කිරීම විධිමත් කළ යුතුය.
- ප්‍රමුඛතා රටවල් සඳහා වීසා රහිත ප්‍රතිපත්තියක් හඳුන්වා දී එම ප්‍රතිපත්තිය හදිසි ආපසු හැරවීම් වලින් තොරව පවත්වාගෙන යාම.

**ගමනාන්ත කළමණාකරණය විමධ්‍යගත කිරීම**

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙතින් ප්‍රාදේශීය ගමනාන්ත කළමනාකරණ සංවිධාන (DMOs) වෙත වගකීම් විමධ්‍යගත කිරීම.
- සංචාරක අමාත්‍යාංශය විසින් ගමනාන්ත කළමනාකරණ සංවිධාන පත් කළ හැකි අතර එම ප්‍රදේශවලට සුදුසු සංචාරක උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා ඒවාට දේශීය ව්‍යාපාර, රාජ්‍ය ආයතන සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමග දිස්ත්‍රික් මට්ටමින් ස්වාධීනව කටයුතු කළ හැකිය.
- ගමනාන්ත කළමනාකරණ සංවිධානවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කළ යුත්තේ කර්මාන්තයේ පළපුරුද්ද, ප්‍රාදේශීය ප්‍රජාවේ පළපුරුද්ද වැනි සුදුසු සහ නිසි නිර්ණායක මතය.
- ගමනාන්ත කළමනාකරණ සංවිධාන ස්වාධීනව ක්‍රියා කළ යුතු අතර කාර්ය සාධනය මැනීමට අවශ්‍ය ප්‍රධානකාර්ය සාධන දර්ශක පැවතිය යුතුය.

- SLTDAට පිටතින් පත් කරන ලද ඕනෑම ආයතනයක් ප්‍රමාණවත් අරමුදල් වලින් බල ගැන්විය යුතු අතර එයට SLTDA සමගින් තීරණ ගැනීමේ බලය තිබිය යුතුය.
- නවාතැන්, ආහාරපාන සහ සංචාරක අත්දැකීම් (විනෝද පා ගමන්, සංස්කෘතික ක්‍රියාකාරකම්, පන්ති) වල නිරත වන කුඩා පරිමාණ ක්‍රියාකරුවනට තිරසාර ලෙස තම ජීවනෝපාය පවත්වා ගැනීමට ආහාර සැකසීම සහ සූපශාස්ත්‍ර කුසලතා, සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ අනුකූලතාවය, පාරිභෝගික සේවය යනාදී අවශ්‍ය වෘත්තීය සහ ව්‍යාපාරික කුසලතාවන් ලබා දීම.

**බලපත්‍ර ලබා ගැනීමේදී නීති රීති දැඩි කිරීම**

- වීසා රෙගුලාසිවලට අනුකූලද යන්න තහවුරු කර ගැනීමට සහ වීසා බලපත්‍ර කල් ඉකුත්ව ඇතිදැයි නිරීක්ෂණය කිරීමට නිරන්තරව විගණන සහ පරීක්ෂණ පැවැත්වීම.
- බදු නීතිවලට අනුකූල දැයි සහතික කිරීම සඳහා විගණන පැවැත්වීම
- රටේ නීතිවලට අනුකූල වීම අධීක්ෂණය කිරීම සඳහා පළාත් පාලන ආයතන තුළ ඒකක පිහිටුවීම.

**වඩා හොඳ ප්‍රවාහනයක් සහ සම්මත ගාස්තු**

- ඉලක්කගත සංචාරක ගමනාන්ත සඳහා වඩා හොඳ ආසන සහ වායු සමීකරණ සහිත සුඛෝපභෝගී හෝ අර්ධ සුඛෝපභෝගී බස් රථ සහ දුම්රිය වැනි වඩා හොඳ පොදු ප්‍රවාහනය සඳහා ආයෝජනය කිරීම.

**වඩා හොඳ ප්‍රවාහනයක් සහ සම්මත ගාස්තු**

- ඉලක්කගත සංචාරක ගමනාන්ත සඳහා වඩා හොඳ ආසන සහ වායු සමීකරණ සහිත සුඛෝපභෝගී හෝ අර්ධ සුඛෝපභෝගී බස් රථ සහ දුම්රිය වැනි වඩා හොඳ පොදු ප්‍රවාහනය සඳහා ආයෝජනය කිරීම.
- දිගු ගමන් සඳහා තදබදය අවම කිරීමට පරිශීලක-හිතකාමී සහ පූර්ණ ක්‍රියාකාරී මාර්ගගත ආසන වෙන් කිරීමේ පද්ධති (user-friendly and fully functional online seat reservation system) හඳුන්වා දීම.

ඉංග්‍රීසි සහ අනෙකුත් ප්‍රධාන විදේශීය භාෂාවලින් බස් රථ සහ දුම්රිය සඳහා විශ්වාසදායක කාලසටහන් හඳුන්වා දීම; මධ්‍යම ප්‍රවාහන මධ්‍යස්ථාන සහ ප්‍රධාන සංචාරක ආකර්ෂණ ස්ථානවල ඒවා ප්‍රදර්ශනය කරන අතරම ඒවා අන්තර්ජාලය ඔස්සේ ද ප්‍රකාශයට පත් කිරීම.

- පැහැදිලිව පෙනෙන මිල ගණන් සහිත ප්‍රමිතිගත ගාස්තු ක්‍රමයක් ඔස්සේ සංචාරක ප්‍රදේශවල ත්‍රිරෝද රථ ගාස්තු නියාමනය කිරීම.

ARUTHA

info@arutharesearch.org
https://arutharesearch.org/